# ‘පට්ඨාන’ ධර්ම දේශනා මාලාව
## ‘වීථි වාර - හේතු ප්‍රත්‍යය’
## 15.03. 2018

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස
නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස
නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස

තුන්ලෝකාග්‍ර වූ භාග්‍යවත් වූ අරහත් වූ සම්මා සම්බුදුපියාණන් වහන්සේට සියලුම සත්වයන්ගේ සන්තාන ගත කෙලෙස් සර්වප්‍රකාරයෙන්ම අවබෝධ කොටගෙන ඒ කෙලෙස් නසා සත්වයාට සසර දුකෙන් මිදී නිවනින් සදාකාලික සැපයට පත්වීමට කරුණාව දැක්වුවා වූ කරුණාවෙන් මාර්ගය දේශනා කොට වදාළා වූ ශාන්තිනායක සම්මා සම්බුදු පියාණන් වහන්සේට උග්ඝටිතඥ්ඤ පුද්ගලයන් විපඤ්චිතඥ්ඤ පුද්ගලයන් නෙය්‍ය පුද්ගලයන් පදපරම පුද්ගලයන් කෙටියෙන් ධර්මය අසා නිවන් අවබෝධකරගන්නා වූ පුද්ගයන් විස්තරාත්මක වශයෙන් ධර්මය අසා ධර්මය අවබෝධකරගන්නා පුද්ගලයන් ප්‍රතිපදාවේ ගමන්කොට හෙමින් හෙමින් ධර්මය අවබෝධ කරගන්නා පුද්ගලයන් දැන ගත්තා වූ ශාන්ති නායක සම්මා සම්බුදු පියාණන් වහන්සේට සත්වයන්ගේ සැපයම කැමති උනාවූ සම්මා සම්බුදුපියාණන් වහන්සේට මම සිරසින් වැද නමස්කාර කරනවා, මාගේ නමස්කාරය වේවා!

ඒ උතුම් ශාන්තිනායක ධර්ම රාජයාණන් වහන්සේ විසින් දේශනා කරනලද නෛර්යාණික ශ්‍රී සත්ධර්මය නවලොව්තුරා ශ්‍රී සත්ධර්ම රත්නයට මම සිරසින් වැද නමස්කාර කරනවා මාගේ නමස්කාරය වේවා!

ඒ උතුම් ධර්ම ප්‍රතිපදාවේ යෙදී කෙලෙසුන්ගෙන් මිදී නිවනට ඇතුල් උනා වූ ඒ නිවන් මාර්ගයේ යෙදෙන්නා වූ අශ්ඨාර්ය පුද්ගල මහා සංඝ රත්නයට මම සිරසින් වැඳ නමස්කාර කරනවා මාගේ නමස්කාරය වේවා!

අනන්ත අපරිමාණ ගුණ ඇති සම්මා සම්බුදුපියාණන් වහන්සේට උතුම් වූ ධර්ම රත්නයට උතුම් වූ සංඝ රත්නයට ගුණ හිතා වන්දනා කිරීමේ උතුම් පිරිසිදු කුසල චේතනාවන්ගේ ධර්ම චේතනාවන්ගේ ආනුභාවබලයෙන් ඒ උතුම් ත්‍රිවිධරත්නයේ අනන්ත අපරිමාණ ගුණානුභාව බලයෙන් මේ පින්වත් අසාගෙන සිටින්නා වූ සැම දෙනාම මේ මොහොත වෙනකොට උපදවාගෙන තිබෙන්නා වූ සියලුම පිරිසිදු මහානුභාවසම්පන්න කුසල ධර්මයන්ගේ අනුභාව බලයෙන්ද සැම දෙනාටම අදත් හොඳ ධර්ම සමයක් වේවා! ධර්මය හිතන ධර්මය අහන කාලයක් වේවා! අද කියලා දෙන්නා වූ දහම් කොටස් ටික ඉතාමත්ම හොඳින් සිහිය නුවණ යොදා අසා ගන්නත් ඒ සියලුම කරුණු නිවැරදිව තේරුම් ගන්නත් සැම දෙනාටම ශක්තිය ලැබේවා!

මේ ධර්මය ඇසීම සසර දුකෙන් මිදී යන්නා වූ මාර්ගයක් ප්‍රතිපදාවක් වේවා! කෙලෙසුන්ගෙන් බධාවක් නොවේවා! නීවරණයන්ගෙන් බාධාවක් නොවේවා! සැම

දෙනාටම චතුරාර්ය සත්‍යය අවබෝධකරගෙන හේතු ඵල ධර්මයන් අවබෝධ කරගෙන උතුම් අමා මහා නිවනින් සැනසෙන්න ලැබේවා! කියලා මෛත්‍රීයෙන් ප්‍රාර්ථනා කරනවා. එසේ ප්‍රාර්ථනා කරමින් අපි අදට කියලා දෙන්න හිතාගෙන තිබෙන ධර්ම කාරණාටික මේ පින්වතුන්ට මතක් කරනවා.

මේ දවස්වල අපි කථා කරන්නේ **හේතු ප්‍රත්‍යය** ධර්ම යටතේ කියවෙන්නා වූ වීථි හෙවත් විසර්ජනා වාර. එක ප්‍රත්‍යය ධර්මයකට වීථි වාර කීපයක් තිබෙනවා. හේතු ප්‍රත්‍යය ගත්තහම හේතු ප්‍රත්‍යය අනිත් ධර්ම වලට ප්‍රත්‍යය වෙන විදිය කියලා දෙන්නා වූ කොටසට තමයි ඔය විසර්ජනා වාරය වීථි වාරය කියලා මතක් කරන්නේ. පට්ඨානය කියන එක මහා විසාල ගම්භීර වූ ධර්ම මාතෘකාවක්. ඒවාගේම ගාම්භීර වූ ධර්ම විග්‍රහයක්. මේක ඉතින් පරෙස්සමෙන් ඕන අපි තේරුම් ගන්න.

අද වෙනකොට අපි වීථි වාර තුනක් කියලා දුන්නා. ඒ කියලා දීපු වීථි වාර තුන අපි නැවත මතක් කරගන්නවා නම් 1) **කුසලො ධම්මො කුසලස්ස ධම්මස්ස හෙතුපච්චයෙන පච්චයො** කියන පළවෙනි විසර්ජනා වාරය කියලා දුන්නා. ඊළඟට **2) කුසලො ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස හෙතුපච්චයෙන පච්චයො** කියන දෙවෙනි වීථි වාරය කියලා දුන්නා. ඊළඟට කියලා දුන්නා 3) **කුසලො ධම්මො කුසලස්ස ච අබ්‍යාකතස්ස ච ධම්මස්ස හෙතුපච්චයෙන පච්චයො** තුන්වෙනි වීථි වාරය. දැන් මේ ධර්මතා තුනම කුසල ධර්මයෝ කුසල ධර්මයන්ට සහ කුසල ධර්මයෝ අව්‍යාකෘත ධර්මයන්ට හේතු වෙන විදිය තමයි මේකෙන් කියලා දුන්නේ. ඊළඟට අද මම බලාපොරොත්තු වෙනවා ඒකෙ අකුසල පැත්ත කියලා දෙන්න.

වීථි වාරයක් තිබෙනවා මෙහෙම

**4) අකුසලො ධම්මො අකුසලස්ස ධම්මස්ස හෙතුපච්චයෙන පච්චයො** කියලා. අකුසල ධර්මයක් අකුසල ධර්මයට හේතු ශක්තියෙන් හේතු ගුණයෙන් ප්‍රත්‍යය වෙන විදියයි මේ කියන්නේ. මේක තමයි අකුසල පැත්තට යන මාතෘකාව. **අකුසල හේතු** කියලා ටිකක් තිබෙනවා. සම්ප්‍රයුක්තක ධර්ම නැතහොත් සම්ප්‍රයුක්තක චෛතසික සහ සිත කියන්නේ නැතුව මෙහි විස්තර කරන්නේ ඛන්ධ කියලා.

- **අකුසලා හෙතූ සම්පයුත්තකානං ඛන්ධානං හෙතුපච්චයෙන පච්චයො** = අකුසල හේතු සම්ප්‍රයුක්තක ස්කන්ධයන්ට හේතු ශක්තියෙන් ප්‍රත්‍යය වේ.

අපි මේ වෙනකොට ධර්ම අහලා තිබෙනවා යම් යම් මට්ටමෙන්. අපි මේ කාරණය තේරුම් ගැනීමට මේ පදය තේරුම් ගනිමු. **'අකුසලො ධම්මො'** - මේ අකුසල ධර්මය කියන එකෙන් මෙතැන කියන්නේ 'ලෝභ' 'ද්වේශ' 'මෝහ' කියන අකුසල ධර්ම. මේ 'හේතු' මාතෘකාව යටතේ කියවෙන නිසා මේවා තමයි **'අකුසලො ධම්මො'** කියලා කියන්නේ. මේ අකුසල ධර්ම කියන එකට ඇයි එහෙම කියන්නේ? මේ ලෝභයත් ද්වේෂයත් මෝහයත් කියන්නා වූ මේ බල තුනෙන් දෙකක් හරි එකක් හරි මිශ්‍ර වෙලා සිතුවිල්ලක් පහළ උනොත් ඒ සිත කර්කශ ගොරෝසු ශක්තියකින් යුක්තයි. එය අනාගතයේදී කොහේ හරි තැනක නිර්මාණය කරන්නෙත් හදලා දෙන්නෙත් ඒ වාගේම ගොරෝසු කර්කශ විපාක වාරයක්. ඒක නිසා කියනවා වැරදි සහිත දුක් විපාක ලබා දෙනවා කියලා. ඒක නිසා මේ තුන්දෙනා හඳුන්වනවා

**අකුසල හේතු** හැටියට. අකුසල ධර්ම හැටියට. මේ පට්ඨානය තේරුම් ගැනීමට මෙන්න මෙහෙමත් හිතමු.

අපි කියනවා අපිට හිතක් පහළ උනා කියලා. අපි හිතමු ලංකාවේ යම් කිසි දෙයක් අපිට දකින්න ලැබෙනවා. යම් කිසි දෙයක් දකින්න ලැබුණහම ඒ දැකපු දේ පිළිබඳව අපිට යම්කිසි ආසාවක් ඇතිවෙනවා. එහෙම නැත්නම් එතැන ලෝභයක් ඇතිවෙලා තිබෙන්නේ. නමුත් හුදෙක් තනිකරම ලෝභය නොවෙයි හිතක් හැටියට පහළ උනේ. ඒ ලෝභය පහළ වෙන්නේ හිතේ. ලෝභයත් සමග තමයි හිත පහළ වෙන්නේ. ඒ විතරකුත් නොවෙයි, තවත් පහළ වෙනවා සර්ව චිත්ත සාධාරණ චෛතසික ටිකක්. ඊළඟට ප්‍රකීරණක චෛතසික ටිකක් සහ අකුසල චෛතසික ටිකක් පහළ වෙනවා. අකුසල චෛතසික ඔක්කොම තිබෙනවා 14ක්. යම් කිසි ලෝභ සහගත හිතක් අරමුණක් සම්බන්ධයෙන් පහළ වෙනකොට ඒ ලෝභ සහගත අරමුණ පැත්තට හැරිලා නැමිලා මේ පහළ වෙන සිතේ බල ශක්ති විශාල ප්‍රමාණයක් තිබෙනවා. ඒ චෛතසික ධර්ම නැත්නම් චිත්ත ගති රංචුවක් පොදියක් ඒ හිතේ තිබෙනවා. ඒ පොදිය ඇතුලේ එනම් ඒ හිතයි චෛතසික ධර්ම ටික ඇතුලේ ප්‍රධාන කාර්යක් සිද්ධ කරන්නා වූ 'හේතු ධර්ම' තිබෙනවා. එතකොට මේ 'ලෝභ හේතුවයි' 'ද්වේශ හේතුවයි' 'මෝහ හේතුවයි' කියන ඒවා අනිත් චෛතසික වලට වෙන කොහේටවත් යන්න නොදී අරමුණටම හරවලා තබා ගන්න ගතියක් තිබෙනවා. අනිත් එක තමයි එතැන චේතනාවක් තිබෙනවා. ඒ චේතනාව කරන්නේ ඒ චෛතසික ධර්ම සමූහය එකට ගොනු කිරීමක් ඒවගේම කර්ම හැදීමක් යම් කිසි බලයක් හැදීමක්. ඒ බලය හදනකොට ලෝභයත් තිබුණා නම් එතැන මෝහයත් තිබුණා නම් එතැන ඒ ලෝභයයි මෝහයයි, ද්වේශයයි මෝහයයි යන මේවාට අනුකූලව තමයි කර්ම හදන්නේ. කර්ම රැස් කරන්නේ. ඉතින් ඒ ලෝභය සමග මෝහය සහ ද්වේශය සමග මෝහය තිබෙන්නා වූ තැනක චෛතසික ධර්ම වලට වෙන වැඩක් කරන්න බෑ, ඒ තුන්දෙනාගේ සම්බන්ධයක් නැතුව ඒ තුන්දෙනාගේ ගෑවෙන්නේ නැතුව. වතුරකට ගොම ටිකක් දැම්මහම ඒක ගොම වතුර වෙනවා. එතකොට වතුරකට මොනවා හරි ජරාවක් දැම්මොත් ඒක ජරා වතුර වෙනවා. වතුරකට කළු පාට දියවී යනදෙයක් දැම්මොත් ඒක කළුපාට වතුර වෙනවා. ඒ වතුරට බෑ කළු අයින් කරලා තමන්ට හුදකලා වෙන්න. ඒ වතුරේ අර කළුටික ඔක්කොම පැතිරිලා මිශ්‍රවෙලා යනවා. ඒවගේ මේ කියන්නා වූ අකුසල හේතු තුන ලෝභ යයි මෝහයයි ද්වේශයයි යන තුන්දෙනා යම්කිසි හිතක ඇති උනොත් එහෙම එතැන අනිත් ඒවා ඔක්කොම ඒකේ ආකාරය ගන්නවා. කළුවෙලා යනවා, අනිත් එක අපාට වෙනවා. මේ 'ලෝභ හේතුව' 'දෝස හේතුව' 'මෝහ හේතුව' කියන හැඬේට තමයි හරවන හැඬේට තමයි අනිත් ඒවාට ක්‍රියාත්මක වෙන්න වෙන්නේ. ඒක එහෙම උනහම අනාගතයේදී ඇතිවෙන්නා වූ කර්ම ශක්තියේ විපාක එනකොට එතැනත් කළුපාට විපාකයක් තමයි ඇතිවෙන්නේ. අප්‍රසන්න නීරස කටුක කර්කශ විපාක ශක්තියක් තමයි මතුවෙලා එන්නේ. ඒක නිසා මේ විදියට අකුසල ධර්මය කියන එක අපි තේරුම් ගන්න ඕනෑ. ඊළඟට මේ 'ලෝභ' 'ද්වේශ' 'මෝහ' කියන තුන්දෙනා ඉන්න තැනුත් අපි බලාගනිමු.

අකුසල් සිත් දොළහක් තිබෙනවා. ලෝභ මූල සිත් තිබෙනවා අටක්. ඒ ලෝභ මූල සිත් අටේ ලෝභයයි මෝහයයි දෙක තිබෙනවා. ද්වේශ සහගත සිත් දෙකක් තිබෙනවා. ඒකෙ ලෝභයයි ද්වේශයයි දෙක තිබෙනවා. ඊළඟට මෝහ සහගත සිත් දෙකක් තිබෙනවා. ඒකෙ තිබෙනවා අනිත් චෛතසික සමග මෝහ හේතුව විතරක්. මෙන්න මේ කියන්නා වූ සිත් 12 ගැන තමයි **අකුසලො ධම්මො අකුසලස්ස ධම්මස්ස හෙතුපච්චයෙන පච්චයො** කියන මාතෘකාව යටතේ කියලා දෙන්නේ.

තව එකක් තිබෙනවා. අපේ පින්වතුන් දැනගන්න ඕන මෙතැන මේ පාලි වාක්‍යයේ සම්බන්ධ තාවයක් තිබෙනවා මෙහෙම.

**අකුසලා හෙතූ** = ඒ කියන්නේ 'ලෝභ' 'දෝස' 'මෝහ' කියන අකුසල හේතු තුන

**සම්පයුත්තකානං ඛන්ධානං** = මෙතැන ඛන්ධ කියලා කියන්නේ චෛතසික ධර්මයන්ට පාවිච්චි කරන තවත් නමක්. ඒ චිත්ත චෛතසික ධර්ම ස්කන්ධ වශයෙන් බෙදෙන විදියට ගන්නවා. වේදනාව සංඥාව දෙක වෙන් කරගන්නවා. සිත වෙන් කරගන්නවා. ඊටපස්සේ අනිත් චෛතසික ටික වශයෙන් සියල්ලම ගොඩවල් 4 කට වෙන් කර ගන්නවා = **සම්පයුත්තකානං ඛන්ධානං** = එකට උපදින්නා වූ ධර්ම හැටියට.

අපි ඕක මේ විදියට තේරුම් ගන්න බලමු. දැන් සාමාන්‍ය ලෝකයාට බණ දේශනා කරනකොට සාමාන්‍ය අවබෝධයක් වැටහීමක් තිබෙන්නා වූ කෙනෙකුට ධර්මයක් කියලා දෙනකොට අපි ලෝකයේ ප්‍රකට මනුස්සයෙක් කරන ක්‍රියා දොරටු සම්බන්ධ කරගෙන තමයි කියලා දෙන්නේ. ඒක ලේසියි. හේතුව, ඒ මනුස්සයට ඒක තේරුම් ගන්න ලේසියි, හිත කියන සියුම් ධර්මය තේරුම් ගන්නවාට වඩා. කයින් කියලා කිව්වහම කායද්වාරයෙන්, ඒ වාගේම වාග්ද්වාරයෙන් කියලා කිව්වහම ටිකක් ලේසියි තේරුම් ගන්න. ඒවා ක්‍රියා වශයෙන් දක්වනවා. ඒකනිසා තමයි 'සතුන් මැරීම' 'සොරකම් කිරීම' 'කාමයෙහි වරදවා හැසිරීම' කියන ටික කයට දාල මේ වැරදි තුන නම් කරන්නේ. ඊට පස්සේ 'බොරු කීම' 'කේලාම් කීම' 'සැර වචන කීම' 'හිස් වචන කීම'. මේකෙන් වචනයෙන් සිද්ධ වෙන්නා වූ ක්‍රියාවල් පෙන්නනවා. ඊළඟට හිතෙන් 'තද ලෝභය' 'තරහ ගතිය' 'මිත්‍යා දෘෂ්ඨිය'. මේවා හිතෙන් සිදු උනත් ක්‍රියාත්මක වෙන හැටි පිටට පෙන්නන්න පුළුවන්. මේවා අකුසල ධර්ම 10 හැටියට තමයි ලෝකයට කියලා දෙන්නේ. නමුත් ප්‍රාණ ඝාතය කරන වෙලාවේදී හොරකම් කිරීමක් වෙන්නේ නෑ. හොරකම් කරන වෙලාවේදී මිත්‍යාචාරය යෙදෙන්නේ නෑ. මිත්‍යාචාර වේලාවේදී මුසාවාදය කෙරෙන්නේ නෑ. එක වේලාවකට එක කාරණයක් තමයි ඉස්මතු වෙලා ඉදිරිපත් වෙලා එන්නේ. අනිත් ඒවා තිබෙන බව හැබැය. නමුත් එක ක්‍රියාවක් සිද්ධ කරනකොට ඒ කයින් කරන ක්‍රියාව සිතෙන් තමයි operate වෙන්නේ. ඔය වේලාවේදී 'ලෝභ සහගත සිත්' හෝ 'ද්වේශ සහගත සිත්' හෝ 'මෝහ සහගත සිත්' හෝ පහළ වෙන්න ඕනෑ. ඒ සිත් ඇවිල්ලා ඒ සිත් ඇතුලේ තිබෙන චෛතසිකත් එක්ක ජවන් සිත් පේළියක් යනකොට ඒ ජවන් සිත් පේළිය ක්‍රියාත්මක වීමම සතුන් මැරීම වශයෙන් හරි සොරකම් කිරීම් වශයෙන් හරි මිත්‍යාචාරය වශයෙන් හෝ බොරු කීම් වශයෙන් ඔය විදියට එනවා. ආන්න ඒ කියන්නා වූ චිත්ත වීථිවල පහළ වෙන ජවන් සිත්වල කෙරෙන්නා

වූ කාර්යක් තමයි **අකුසලො ධම්මො අකුසලස්ස ධම්මස්ස හෙතුපච්චයෙන පච්චයො** කියලා කියන්නේ. ඔය කර්ම හැදෙන තැන් 12ක් ගැන කියනවා.

නැවත් සිහිපත් කරනවා නම් මෙතැන තිබෙනවා **'හේතු ප්‍රත්‍යය'** ශක්තිය. හේතු ප්‍රත්‍යය ශක්තිය ගන්නා වූ ධර්ම තිබෙනවා. මේක හරි පුදුම දෙයක්. අකුසල වර්ගයේ හේතු ප්‍රත්‍යය ශක්තිය තිබෙන්නේ 'ලෝභයටයි' 'මෝහයටයි' 'දෝසයටයි' විතරයි. අනිත් ඒවාට එහෙම අකුසල හේතු ප්‍රත්‍යය ශක්තියක් නෑ. අනිත් චෛතසික ධර්ම වලටත් නෑ. හිතටත් නෑ. මේ තුන්දෙනාට විතරයි තිබෙන්නේ. එතකොට මේ තුන්දෙනාගේ ඒ හේතු ප්‍රත්‍යය ශක්තිය නිසා අනිත් චෛතසික ධර්මයන්ට සිද්ධ වෙනවා ඒවායේ ප්‍රත්‍යය ශක්තිය ලබන්න. ඒකට කියනවා **ප්‍රත්‍යය උප්පන්න** ස්වභාවය කියලා. ඒ කියන්නේ ප්‍රත්‍යය ලබන්නා කියන එකයි. තැනකින් බලපෑමක් සිද්ධ වෙනවා, අනිත් ඒවා ඒ බලපෑමට යටත් වෙනවා. හිතයි අනිත් චෛතසික ධර්මයි වලට වෙන්නේ ප්‍රත්‍යය ධර්ම බලපෑම් කරනකොට ඒකට අනුයාතවෙලා යටත් වෙලා ඒ පැත්තට කියන විදියට කටයුතු කරලා ඉන්න එක. ඔය විදියට ජවන් සිත් පහළ වෙනකොට ඇතිවෙන්නා වූ ඒ හැමතැනම සිද්ධ වෙන්නේ **අකුසලො ධම්මො අකුසලස්ස ධම්මස්ස හෙතුපච්චයෙන පච්චයො.** ඔය තමයි 'හේතු' 'ප්‍රත්‍යය' වෙන විදිය.

ඊළඟට අකුසල ධර්ම යටතේ දෙවෙනි වීථිය

## 5) අකුසලො ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස හෙතුපච්චයෙන පච්චයො

අපි ඉස්සෙල්ලා අකුසල ධර්ම කියලා කිව්වේ 'ලෝභ' 'ද්වේශ' 'මෝහ' කියන්නා වූ 'හේතු' ධර්ම තුන. **අබ්‍යාකතස්ස ධම්මස්ස** කියලා කියන්නේ අව්‍යාකෘත හැටියට සලකන්නා වූ ධර්ම. රූප ගන්නෙත් අව්‍යාකෘත ධර්ම වලට. හේතුව, අව්‍යාකෘත ධර්ම ස්ථාන කීපයක කථා වෙනවා. අපේ මේ අහගෙන ඉන්න පින්වතුන් මේක නැවත තේරුම් ගන්න, රූප කියන ඒවා ඔක්කෝම අව්‍යාකෘතයි. අනිත් එක තමයි ඔය සිත් වලත් තිබෙනවා අහේතුක විපාක සිත් කියලා ජාතියක්. ඒ විපාක සිත් කියන ඒවා අව්‍යාකෘතයි. ඒවාට කියනවා විපාක අව්‍යාකෘත කියලා. එතකොට බලන්න **රූප අව්‍යාකෘත තිබෙනවා.** ඒවාට බෑ වෙන මොකක්වත් කරන්න. අනාගතයේදී පහළ වෙන්නා වූ දේවල් කරන්න බෑ. **විපාක අව්‍යාකෘත තිබෙනවා. ක්‍රියා අව්‍යාකෘත තිබෙනවා.** අනිත් එක තමයි **නිර්වාණ ධාතුව අව්‍යාකෘතයි.**

දැන් මෙතැන **අකුසලො ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස හෙතුපච්චයෙන පච්චයො** කියලා කියන තැන රූප අව්‍යාකෘතය තමයි සලකන්නේ. අපි මේ වෙලාවේ යම්කිසි දෙයක් කරනකොට මේ අකුසල් සිත් ටික පහළ වෙන්න ළඟම ඉන්න එක්කෙනා තමයි අකුසල් සිත් ක්‍රියාත්මක කරන්නා වූ ශරීරය. විශේෂයෙන් රූප ධර්ම ටික. ඒක නිසා **අකුසලො ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස හෙතුපච්චයෙන පච්චයො** කියන තැන රූප ටික ගණන් ගන්නවා. මේ රූප තිබෙන තැන් තිබෙනවා. අව්‍යාකෘත ධර්ම වලට හේතු ශක්තියෙන් බලපෑමක් කරන්නා වූ ඒවා තිබෙන්නේ රූපයක් තිබෙන භූමියක. එනම් දිව්‍යලෝකේ හෝ බ්‍රහ්ම ලෝකයේ හෝ මනුස්ස ලෝකයේ හෝ තිරිසන් ලෝකයේ හෝ කොතැන හෝ තැනක රූපයක් තිබෙන තැනක් වෙන්න ඕන. පංච වෝකාර භූමියකම වෙන්න ඕන. වෙන තැන්

වල ඕක පහළ වෙන්නේ නෑ. මේ අව්‍යාකෘත ධර්ම වලට කුසලත් නොවෙන අකුසලුත් නොවෙන චිත්තජ රූප ශක්තියක් තිබෙනවා. ඒ අකුසල් ජවන් එක්ක පහළ වෙනකොට ඒ ජවන් සමගම නිෂ්පාදන වෙන්නා වූ චිත්තජ රූප කියලා ඇඟේ හැදෙන්නා වූ රූපස්වභාවයක් තිබෙනවා. ආන්න ඒකට බලපාන හැටි තමයි කියන්නේ. ඒක හොඳට විස්තර කරනවා මෙහෙම. **අකුසලා හෙතූ චිත්තසමුට්ඨානානං රූපානං හෙතුපච්චයෙන පච්චයො** = අකුසල හේතු සිතනිසා හටගන්නා වූ රූපයන්ට හේතු ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙයි කියලා හොඳ පැහැදිලි විග්‍රයක් කරනවා. රූපයන්ට බලපාන විදිය තමයි මේකෙන් කියන්නේ.

දැන් බලන්න **අකුසලො ධම්මො අකුසලස්ස ධම්මස්ස හෙතුපච්චයෙන පච්චයො** කියලා කිව්වා. එනම් අකුසල ධර්මයක් අකුසල චෛතසික ධර්මයන්ට උපකාර වෙන විදිය කිව්වා. දැන් මෙතැන කියන්නේ **අකුසලො ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස හෙතුපච්චයෙන පච්චයො** කියන වාක්‍ය. එනම් අව්‍යාකෘත රූපයකට බලපාන විදිය.

ඊළඟට තිබෙනවා මෙහෙම.

**6) අකුසලො ධම්මො අකුසලස්ස ච අබ්‍යාකතස්ස ච ධම්මස්ස හෙතුපච්චයෙන පච්චයො** = ලෝභය කියන චෛතසිකයයි ද්වේශය කියන චෛතසිකයයි මෝහය කියන චෛතසිකයයි තුනම අකුසල 'හේතු' තුනක්. ඒ අකුසල හේතු තුන අව්‍යාකෘත හැටියට සලකන්නා වූ ධර්ම වලටයි අනිත් චිත්ත චෛතසික ධර්මයන්ටයි බලපාන විදිය මේ වාක්‍යයෙන් කියලා දෙනවා.

මේක සිද්ධ වෙන්නේ මෙහෙමයි. අපි හිතමු මනුස්සයෙක් යමක් හොරකම් කරනවා. කයින් ඒක සිද්ධ වෙනවා. කෙනෙකුගේ දෙයක් අනිත් කෙනාට නොදන්වා හොර හිතින් ගන්නවා. හොර හිතින් අනුන්ගේ වස්තුවන් ගැනීමට අත මෙහෙය වන්න ඕනෑ. ශරීරය එතැනට යන්න ඕනෑ. අත්දෙකෙන් ගන්න ඕනෑ. ක්‍රියාවක් තිබෙනවා හොරකම් කරන. ශරීරයේ මේ ක්‍රියාව සිද්ධ වෙන්නේ ඒ ශරීරය ක්‍රියාත්මක කරන ස්වාමියාට යටත්ව. කවුද ඒ ස්වාමියා? ඒ තමයි හිත. ඒ සිතේ පහළ වෙනවා ජවන් සිත්. අනිත් කෙනෙකුට අයිති දෙයක් තමන් පැත්තට හරවා ගන්න ලබා ගන්න අකුසල් ජවන් සිත් පහළ වෙනවා. ලෝභ සිතකින් සොරකම් කරන නිසා මේ ජවන් සිත් ලෝභ සිත්. ඒ ලෝභ ජවන් වල තිබෙනවා ලෝභ යයි මෝහයයි. ලෝභයයි මෝහයයි කියන ධර්මතා දෙක ඒ ජවන් සිත් වල තිබෙන්නා වූ අනිත් චෛතසික ධර්ම වලටයි අකුසල සිතටයි උපකාර වෙනවා වගේම එකම වේලාවේ අපේ ඇඟේ චිත්තජ රූප හදන්නත් ඒක මහා බලයක් උපකාරයක් වෙන නිසා තමයි අර අත එහෙට මෙහෙට යවලා අනිත් අයට අයිති දෙයක් ගන්නේ. එතකොට ඒ ගැනීමේ ක්‍රියාව සිද්ධ කරන්නේ මෙහෙයවන්නේ හිත. ශරීරය තමයි රූපය. එතකොට මෙතැනදී 'අකුසල හේතුව' අනිත් වේදනා සංඥා සංඛාර විඤ්ඤාණය කියන චෛතසික ඛාණ්ඩ හතරටත් සිතෙන් හට ගන්නා වූ චිත්තජ රූපයන්ට හේතු ප්‍රත්‍යය ශක්තියෙන් ප්‍රත්‍යය වෙනවා.

- **අකුසලා හෙතූ සම්පයුත්තකානං ඛන්ධානං චිත්තසමුට්ඨානානඤ්ච රූපානං හෙතුපච්චයෙන පච්චයො.**

මේවා අපි නොසිතා හිටියට මේ ශරීරයෙන් කෙරෙන්නා වූ වැඩ වලට වචනයෙන් කෙරෙන්නා වූ වැඩ වලට ලෝභ චෛතසික ධර්මය ඇතුළු අනෙක් චෛතසික ධර්මත් අපිට නොපෙනෙන විදියේ මහා පුදුම විදියේ බලපෑමක් ඒ වගේම මෙහෙයවීමක් කරනවා. ඒක තමයි අපේ මේ වචනයෙන් අපේ මේ කයෙන් බාහිරයට පේන්නේ. එහෙම මෙහෙය වීමක් නැත්නම් කිසිම අකාරයකින් කරන්න පුළුවන් කමක් නෑ. අනිත් එක තමයි අපිට ඇතුලත පේන්නේ නෑ. ඒකෙ මහා පුදුම බලයක් තිබෙන්නේ. අපේ පින්වතුන් දැකලා ඇති මේ කාලේ hydraulic machines එහෙම තිබෙනවා. ඒවා පිටට පේනවා. ඒවා යකඩ වලින් හදාපු ලොකු machines. ඒවාට පුළුවන් ඔය මහා විසාල පොළොවවල් හාරන්න තල්ලු කරන්න පස් කණ්ඩි කඩන්න ඒවා අයින් කරන්න. ඒවාගේම විසාල ගල් පර්වත පවා එහෙට මෙහෙට කරන්න පුළුවන් ගතියක් තිබෙනවා. හැබැයි ඒ machine එක නවත්වලා තිබෙනකොටත් එකම ප්‍රමාණයි. යනකොටත් එකම ප්‍රමාණයයි. ඒක ප්‍රමාණය වශයෙන් එක උනාට ඒකෙ තිබෙන යකඩ මනුස්සයෙකුට අදින්න බෑ. හරවන්න බෑ. උස්පහත් කරන්න බෑ. නමුත් ඒක ඇතුලේ තිබෙනවා ඒ බර, ඒ දිග handle එක එහෙට මෙහෙට කරන්න පුළුවන් නමන්න පුළුවන් අකුළවන්න පුළුවන් දිග හරින්න පුළුවන් ඒවාගේම මේ පොළොවේ පස් කණ්ඩියක් ගල් පර්වතයක් ගලවලා ගන්න පුළුවන් ගතියක්. ඒ ශක්තිය අපිට පේන්නේ නෑ. අපිට පේන්නේ පිටින් තිබෙන්නා වූ යකඩ ගොඩ පමණයි. ඒ බර දේ handle කරන්න පුළුවන් ශක්තියක් නිෂ්පාදනය වෙන්නේ ඒ machine එක ඇතුලේ. ඒ වගේ අපේ ශරීරය මෙහෙයවන වචනය මෙහෙයවන ශක්තියක් මේකේ අස්සේ තිබෙනවා. ඒක එක එක තැන් වලට බෙදිලා යනවා. ජවන් සිත් එක්ක මෙහෙයවනවා. Machine එක ඇතුලේ hydraulic ගතිය හැදෙනකොට ඒවාගේම ඒකෙ ශක්තිය වැඩිවෙනකොට ඒ machine තිබෙන්නා වූ ආන්න පන්න එහෙට මෙහෙට ක්‍රියාත්මක වෙනවා. මනුස්සයෙකුට උස්සන්න බැරි උනාට ඒවා එහෙම ක්‍රියාත්මක වෙනවා. ආන්න ඒ වගේ මෙහෙය වීමට යටත්වෙන ස්වභාවයක් තමයි මේ ශරීරය අස්සේ තිබෙන්නේ. එතකොට ඒ 'ලෝභ' 'දෝස' 'මෝහ' කියන ශක්තිය **අකුසලා හෙතූ** = (අකුසල හේතු) - ඊළඟට ඒවාට යටත් වෙන්නා වූ ධර්ම ස්වභාවය ටිකයි තමයි **සම්පයුත්තකානං ඛන්ධානං** = ( සම්ප්‍රයුක්තක ස්කන්ධ) **චිත්තසමුට්ඨානානඤ්ච රූපානං** = (චිත්ත සමුට්ඨානික රූපයන්ට) **හෙතුපච්චයෙන පච්චයො** = (හේතු ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනවා) කියලා කියන්නේ.

'කාම' 'රූප' 'අරූප' කියලා ස්ථාන තිබෙනවා. නැත්නම් අපි කියනවා 'ඒක වෝකාර' 'චතු වෝකාර' 'පංච වෝකාර' කියලා. මේ ස්ථාන වලින් මේ කාරණය සිද්ධ වෙන්න නම් පංච වෝකාරයක් වෙන්න ඕන. ඒ කියන්නේ සිතකුයි කයකුයි දෙකම තිබෙන්න ඕනෑ. අරූපාවචර ලෝකයේ ඕක සිද්ධ වෙන්නේ නෑ. හේතුව එතැන රූප නැති නිසා.

අනිත් එක තමයි අසඤ්ඤ තලයේ ඕක සිද්ධ වෙන්නේ නෑ. හේතුව එතැන සිත නැති නිසා. දැන් මේ කියන කථාව වෙන්න නම් පංච වෝකාරයක්ම වෙන්න ඕනෑ. දැන් මම මේ පින්වතුන්ට **අකුසලො ධම්මො අකුසලස්ස ච අබ්‍යාකතස්ස ච ධම්මස්ස හෙතුපච්චයෙන පච්චයො** වෙන තාලේ කියලා දුන්නා. ඊළඟට තිබෙනවා

## 7) අබ්‍යාකතො ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස හෙතුපච්චයෙන පච්චයො

මෙතැනදී පරෙස්සම් වෙන්න ඕනෑ. ඒ තමයි මෙතැන **අබ්‍යාකතො ධම්මො** කියලා කියන්නෙත් **හේතුම** තමයි. හැබැයි ඒවා 'විපාක සිත් වලයි' 'ක්‍රියා සිත් වලයි' වෙන දෙයක්. මේ අව්‍යාකෘත ධර්මය අව්‍යාකෘත ධර්මයට හේතු ශක්තියෙන් ප්‍රත්‍යය වෙන විදිය. ඒක වෙන්නේ මෙහෙමයි. ඒකෙ විග්‍රය වාක්‍ය හොඳට තේරුම් ගන්න.

'විපාක අව්‍යාකෘත' 'ක්‍රියා අව්‍යාකෘත' කියලා දෙකක් තිබෙනවා. අහේතුක සිත් වල තිබෙනවා 'විපාක අව්‍යාකෘත'. තවත් තිබෙනවා කුසල් සිත් 8 විපාක අව්‍යාකෘතයි. අපි උදාහරණයක් හැටියට ගත්තොත් එහෙම එතැන තිබෙන්නේ කාමාවචර සහේතුක විපාක සිත්. කාමාවචර සහේතුක ක්‍රියා සිත් තිබෙනවා. රූපාවචර සහේතුක විපාක සිත් සහ ක්‍රියා සිත් තිබෙනවා. මේ සිත් වල තිබෙනවා අලෝභ අදෝස අමෝහ. මේ 'අලෝභ' 'අදෝස' 'අමෝහ' කියන දේවල් විපාකයක පහළ වෙනකොට ඒවාට කියන්නේ **අව්‍යාකෘත හේතු** කියලා. රහතන්වහන්සේලාගේ හිත්වල 'අලෝභය' තිබෙනවා. 'අද්වේශය' තිබෙනවා. 'අමෝහය' තිබෙනවා. ඒ රහතන්වහන්සේලාගේ සිත්වල තිබෙන්නා වූ ඒ 'අලෝභ' 'අමෝහ' 'අදෝස' කියන්නා වූ ඒ 'හේතු' සලකන්නේ **ක්‍රියා අව්‍යාකෘත** කියලා. එතකොට ඒවා රහතන්වහන්සේලාගේ සිත්වල පහළ වෙන අනිත් **චෛතසිකයන්ටත් සිත් වලටත් සම්ප්‍රයුක්තක ස්කන්ධයන්ටත්** උන්වහන්සේලාගේ ශරීරවල පහළ වෙන **චිත්ත සමුට්ඨානික රූපයන්ට හේතු ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය** වෙනවා.

- **විපාකාබ්‍යාකතා කිරියාබ්‍යාකතා හෙතූ සම්පයුත්තකානං ඛන්ධානං චිත්තසමුට්ඨානානඤ්ච රූපානං හෙතුපච්චයෙන පච්චයො.**

දැන් මේ රූපත් අව්‍යාකෘතයි හේතු ටිකත් අව්‍යාකෘතයි. විපාක සිතක හේතු ධර්මයෝ අව්‍යාකෘත වෙනකොට ඒ විපාක සිතේ තිබෙන්නා වූ අනිත් ධර්ම අව්‍යාකෘත නොවී තිබෙන්නේ නෑ. ඒක අව්‍යාකෘත වෙනවාමයි. ඒකනිසා ඔය විදියට අව්‍යාකෘත වාර වශයෙන් තිබෙන්නේ එකයි.

දැන් මම මේ වෙනකොට කුසල හේතු එහෙම නැත්නම් **කුසලො ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස හෙතුපච්චයෙන පච්චයො** යනාදී වශයෙන් කුසල වාර වශයෙන් තුනකුත් අකුසල වාර වශයෙන් තුනකුත් අව්‍යාකෘත වාර වශයෙන් එකකුත් පින්වත් සැම දෙනාටම මතක් කළා කියලා දුන්නා. මේ **හේතු ප්‍රත්‍යය** යටතේ විසර්ජනා වාර දක්වන්නේ හතක් පමණයි. ඒ හත අපි පැහැදිලිව තේරුම් ගන්න ඕනෑ. අමුතු ශක්ති ස්වභාවයක් තමයි මේකේ තිබෙන්නේ. අපි 'සිත්' කියලා කියනවා නමුත් අමුතුම ගුණ ස්වභාවයක් අමුතුම ක්‍රියා ස්වභාවයක් තමයි මේකේ තිබෙන්නේ. ඉතින් ඒවා එකිනෙකට එකිනෙකට බලපාන

විදිය තමයි මේකේ සඳහන් වෙන්නේ. බුදුරජාණන්වහන්සේගේ තිබෙන්නා වූ ඒ ඥාන ශක්තිය කොච්චරද කියලා තේරුම් ගන්න අපිට යන්තම්වත් හිතීමක් ඇතිවෙන්නේ සිතක් පහළ වීමක් සිද්ධ වෙන්නේ මේ විදියට මේවා පිළිබඳව හිතාගෙන හිතාගෙන යනකොට.

අපි දැන් නැවත දැනගන්න ඕනෑ අපේ මේ පින්වත් ධර්ම සකච්ඡා මණ්ඩලයේ ඉන්න පින්වතුන්ගෙන් මේ කියාපු කාරණා ටික මේ පින්වතුන්ට හොඳට තේරුණාද කියලා. අනිත් එක තමයි අපි මානසික වශයෙන් අමුතු ලොකුකමක් හිතා ගන්න හොඳ නෑ. ඒ කියන්නේ අපිට මේක තේරෙනවා කියලා හරි නැත්නම් හීන භාවයක් ඇතිකරගන්න හොඳ නෑ මේක අමාරුයි කියලා හරි. 'මම මේ විදියට ප්‍රශ්නයක් ඇහුවොත් මට මේකෙන් ලැබෙන උත්තරය මට නීරස වෙන්න පුළුවන්. මගේ තත්වයට ඒක නොගැලපෙන දෙයක් වෙන්න පුළුවන්' කියලා එහෙම හිතෙන්න පුළුවන්. එහෙම හිතන්නේ නැතුව වෙනදා ප්‍රශ්න අහනවා වගේම අපේ මේ අහගෙන ඉන්නා වූ අනිත් පින්වතුනුත් ප්‍රශ්න අහන්න. ඒක ප්‍රාථමික ප්‍රශ්නයක් උනාට විග්‍රහ කිරීමේදී ඒක හරියට ප්‍රයෝජනවත් වෙනවා වටිනවා. මේ පින්වතුන්ගේ තැනට ගිහිල්ලා විස්තර කරන කොට ඒක හරියට වටිනවා. හැම දෙනාටම තේරෙනවා. තේරුම් ගන්න අමාරුකමක් තිබෙන අයටත් ඒක පිහිටක් වෙනවා. ඒවාගේම තේරුමක් තිබෙන්නා වූ අයටත් තවත් විදියකට ඒක හිතන්න පිහිටක් වෙනවා.

ඒක නිසා මේ වේලාවේදී අපේ පින්වතුන්ට මම මතක් කරනවා මේ කියපු ටික මේ පින්වතුන් තේරුම් ගත්තු විදිය මේ පින්වතුන්ට තේරුම් ගිය විදිය කරුණාවෙන් මතක් කරන්න කියලා. මේ ධර්ම සාකච්ඡා කිරීම මේ විදියට ධර්මයේ සියුම් තැන සෙවීම මෙනෙහි කිරීම අනාත්ම සංඥාව වැඩි දියුණු කිරීමක්. අපිට තිබෙන්නේ ආත්ම සංඥාව. මේවා තුල ආත්මයක් නෑ. මෙහි තිබෙන්නේ එකිනෙකට ප්‍රත්‍යය වෙන්නා වූ ධර්ම ස්වභාවයක් විතරයි. ගහක් හැදෙනකොට ඒ ගහට අව්ව වැටෙනකොට පොළොවේ තිබෙන පොහොර ටික වතුර ආශ්‍රයෙන් එනකොට සුළඟ එනකොට ඒකේ අමුතු විදියකට වෙනස් වීමක් සිද්ධ වෙනවා. පුංචියට තිබුණ බීජයක් පොඩ්ඩක් ඉස්සිලා බෙදිලා පාටත් වෙනස්වෙලා උඩට උඩට කොළ අතු බෙදීගෙන එනවා. ඒක වෙනස් වීමක්. ඒක පොඩි අවස්ථාවේ ඉඳලම විකුර්තියට වෙනස් වීමට පත්වෙනවා. අපි ඒ වෙනස් වීම නම් කරනවා ගහ වැඩෙනවා කියලා. ගහ වැඩෙනවා ගහ හැදෙනවා පැලවෙනවා දියුණුවෙනවා කියලා වචන අපි කථා කරනවා. ඇත්තටම වෙලා තිබෙන්නේ ප්‍රත්‍යය ධර්ම ලැබුණහම අව්වටික සුළඟ ටික වතුර ටික පොහොර ටික ලැබුණට පස්සේ එතැන තිබෙන්නා වූ 'පඨවි' 'ආපෝ' 'තේජෝ' 'වායෝ' 'වර්ණ' 'ගන්ධ' 'රස' 'ඕජා' කියන ධර්මතා 8 බීජ නියාමයට අනුකූලව විකුර්තියක් වී තිබෙනවා. එච්චරයි වෙලා තිබෙන්නේ. ඒක ආත්මයක් නොවෙයි. ඒක සත්වයෙක් නොවෙයි. සුළඟ ආත්මයක් නොවෙයි. පොළොව ආත්මයක් නොවෙයි. පොහොර ආත්මයක් නොවෙයි. අතු ආත්මයක් නොවෙයි. බීජ ආත්මයක් නොවෙයි. ඒ ධර්ම ටික එක පොදියට එක තැනක විකුර්තියකට පත් උනා. ඒකට වටපිටාවේ තිබෙන අව්ව වැස්ස පොහොර ආදී දේවල් යම් කිසි හේතු උපකාරයක් වෙලා තිබෙනවා. ඒවගේ මේ කියන්නා වූ සිතේ පහළ වෙන්නා වූ 'ලෝභ' 'දෝස' 'මෝහ' 'අලෝභ' 'අදෝස' 'අමෝහ' කියන්නා වූ **හේතු ධර්මයෝ** අනිත් ධර්ම වලට ඔන්න ඔය විදියට සත්වයෙක්

නොවී ජීවයක් නොවී ආත්මයක් නොවී අනිත් ඒවාට බලපෑම් කරන අනිත් ඒවාට ප්‍රත්‍යය වෙන ගති ස්වභාවයක් විතරක් මේවා තුල තිබෙනවා. එක තැනක සිද්ධ වෙන්නා වූ ගති ටිකක් විකුර්තියකට පත්වෙන ආකාරය විකුර්තියකට පත්වෙන්න බලපෑම් කරන ස්වභාවය බලපෑම් ලබන ස්වභාවයයි මේ විදියට මතක් කළේ. හොඳයි අපේ පින්වතුන්ට අපි අවස්ථාව සලසලා දෙනවා ප්‍රශ්න එහෙම තිබෙනවා නම් අහලා දැනගන්න. සැමදෙනාටම ධර්ම අවබෝධය වේවා කියලා මෛත්‍රියෙන් ප්‍රර්ථනා කරනවා. තෙරුවන් සරණයි!

<u>ප්‍රශ්නය</u> - අවසරයි ස්වාමීන්වහන්ස ඔබ වහන්සේ දේශනා කළ පරිදි විපාක විදියට සිත් පහළ වෙනකොට චිත්තජ රූප ඇතිවෙන බවක් කිව්වා. එතකොට ඒ ශක්තිය මැඩ පවත්වා ගන්න ඒ පැත්තට නොයා ඒකෙන් වැළකෙන විදියට කොහොමද සිත පුරුදු කරන්නේ ස්වාමීන්වහන්ස?

<u>පිළිතුර</u> - ඔය මහත්තයාගේ ප්‍රශ්නය ගොනුවෙන්නේ සූත්‍රානුසාරයෙන්. දැන් මෙහෙම තිබෙනවා. අපි හිතමු ශරීරයේ යම්කිසි නීරස කටුක කර්කශ රළු ගොරෝසු අප්‍රසන්න වේදනාවක් එනවා කියලා. අපි උපකල්පනය කරනවා ඒ වේදනාව විපාකයක් කියලා. ඒ විපාකය මට දැන් ආවා. දැන් ඒක විඳ ගන්න අමාරුයි. හරි සැරයි. වේදනායි. කටුකයි. සිතින්ම තමයි ඔක සිද්ධ වෙන්නේ. ඒ වෙලාවේ අසන්තෝස ගතියක් ඒකට ඇතිවෙලා දැන් ඒ ශරීරයේ ඇතිවෙච්ච වේදනාව පැත්තට වේදනාව විඳවන දෝමනස්ස සිතිවිලි ටිකක් සමානත්රව පහළ වෙනවා. ඒ දෝමනස්ස සිතුවිලි පහළ වෙන වෙලාවේදී ඒ සිතුවිලි වලට සමාන්තරව කයේ ඇතිවෙනවා දෝමනස්ස සහගත විදියට කර්කශ රළු ගොරෝසු රූපමය පරිසරයක්. ඒ වෙලාවේදී ඒ වේදනාකාරී සිතුවිල්ලක් ආව කියලා දැනගන්නවා නම් ශරීරයේ තිබෙන්නාවූ කර්කශ රූප ස්වභාවය රළු ඒවාගේම විඳගන්න බැරි රූපමය පරිසරයක් කියලා දැන ගත්තානම් ඒ දැනගන්න අවස්ථාවේදීම තමන්ගේ සිත වෙනත් දේකට මාරුවෙනවා. මාරු වෙනවා කියලා කියන්නේ හිත දකින පැත්තට හිත මාරුවෙනවා. ඒ වාගේම කය දකින පැත්තට හිත මාරුවෙනවා. ඒ හිත මාරුවෙලා යනවත් එක්කම අර ප්‍රශ්නය නැතිවෙලා යනවා.

හැබැයි මෙතැන කියන්නේ මහත්තයා මේක නැතිකිරීම වත් මේක ඇතිකිරීම වත් නොවෙයි. අභිධර්මයේ තිබෙන්නා වූ ස්වභාවය තමයි මෙන්න මෙහෙම ශක්ති ටිකක් තිබෙනවා, ඒවා වැඩ කරන්නේ මෙන්න මෙහෙමයි, මේවා operate වෙන්නේ මෙහෙමයි කියලා විස්තර කරලා දෙන එක. නමුත් ප්‍රධාන කාරණය තමයි ශක්ති ධර්ම ටිකක් තවත් ගුණ ස්වභාව ශක්ති ධර්ම ටිකකට යම්කිසි බලපෑම් ස්වභාවයක් කරනවා. ඒ ඇරෙන්න මෙතැන කරන්නෙක්වත් ඒවාගේම කරවන්නෙක්වත් ඉදිරිපත් වෙන්නේ නෑ. අන්න ඒක තමයි මේ පට්ඨාන ධර්ම විග්‍රහයෙන් වැඩියෙන්ම උලුප්පුවලා කියන්නේ. සත්වයෙක් නැති ආත්මයක් ජීවයක් නැති ධර්ම ස්වභාව ටිකක් තමයි මේ තිබෙන්නේ.

අපේ ජීවිතියට ඒ වගේ දෙයක් උනාට පස්සේ අයින් කරගන්නේ කොහොමද කියන එක තමයි අපි බලන්නේ, සූත්‍ර අනුසාරයෙන්. ධර්මය මේ විදියට බලනකොට කරන්නේ මොකක් හරි කමක් නෑ ඒ ධර්මය මෙන්න මේ ටික තමයි මෙතැන වැඩ කරන්නේ,

විපාකයේ මේ ටිකයි වැඩ කරන්නේ. ක්‍රියාවේ මේ ටිකයි වැඩ කරන්නේ. අව්‍යාකෘතයේ මේ ටිකයි වැඩ කරන්නේ කියලා ඒ ටික වෙන වෙනම හඳුනා ගන්නවා. ඒකට කියනවා ධර්මයක් දකිනවා කියලා. ධර්මය දකිමින් ධර්මය බලමින් ඉන්නවා. ඒක ධම්මානුපස්සනාවක් වෙනවා. තෙරුවන් සරණයි.

තෙරුවන් සරණයි ස්වාමීන්වහන්ස!

<u>ප්‍රශ්නය</u> - මට මේ වෙලාවේ ප්‍රශ්නයක් ඇති උනා ස්වාමීන්වහන්ස. දැන් අපි දෙවිදියකට ඉගෙන ගන්නවා. දැන් ගොඩක් වෙලාවට ඔබ වහන්සේ ධර්ම දේශනා කරනකොට මගේ හිත පවත්වාගෙන යනවා මම සත්වයෙක් පුද්ගලයෙක් නෑ ශක්තියක් පමණයි කියන එකේම පමණයි මම හිත තියාගෙන යන්නේ. එතකොට මට කිසිම ප්‍රශ්නයක් නෑ. මම මනුස්සයා කියන කෙනාගේ හම ඇට ඔක්කොම අයින් කරලා බලන්නේ තනිකරම අර ශක්තිය දිහා විතරයි. එතකොට ඔබ වහන්සේ සූත්‍ර ගැන කියපු ගමන් මගේ හිත අනිත් පැත්තට පැන්නා. මේ තත්වය කොහොමද අපි පවත්වාගෙන යන්නේ කියලා ඔබ වහන්සේගෙන් මම අවවාදයක් බලාපොරොත්තු වෙනවා. ඔබ වහන්සේගේ දේශනාවෙන් තමයි මම මේක ඉගෙන ගත්තේ. ඔබ වහන්සේට අනේක වාරයක් පිං.

<u>පිළිතුර</u> - ධර්මය බලන බැලුම් ක්‍රම ගොඩක් තිබෙනවා. අපි ඔක්කොටම එකම level එකෙන් බලන්න බෑ. ධර්මය දකිනකොටත් මෙනෙහි කරනකොටත් ඕක ඔහොමමයි. පෙර ආත්ම බලන්න ගියහමත් බුදුරජාණන්වහන්සේට පෙනෙන ප්‍රමාණයයි පසේබුදුවරුන්ට පෙනෙන ප්‍රමාණයයි ශ්‍රාවයන්ට පෙනෙන ප්‍රමාණයයි වෙනස්. නමුත් ඔක්කොම නිවන් දැකලා තිබෙන්නේ. අනාගතයෙත් එහෙමමයි. ඉර්ධි ප්‍රාතිහාර්ය දක්වනකොටත් එහෙමයි. අපි ධර්මය අවබෝධකරගන්න ගියහමත් එහෙමයි. ධර්මය අවබෝධ කරගන්න යනකොට අපි ඔක්කොගේම එකම level එකක් වෙන්නේ නෑ. සමහර අයට ඔය මාතෘකා කථා කරනකොට අනිත්‍යය සංඥාව හොඳට වැඩෙනවා. හොඳට ක්‍රියාත්මක වෙනවා. නමුත් ඒක සමහරුන්ට නෑ. සමහරුන්ට දුක්ඛ සංඥාව සමහර අයට අනාත්ම සංඥාව වැඩෙනවා. ඔය විදියට තමයි වැඩෙන්නේ. එතකොට බුදුරජාණන්වහන්සේ දකිනවා මෙයාට කොච්චර ප්‍රමාණයකට මේක වැටහෙනවද තේරුම් ගන්න පුළුවන්ද කියලා. බුදුරජාණන්වහන්සේ ධර්මය දේශනා කරන්නෙත් ඒ විදියටයි.

ඇත්තටම මේ කථා කරන්නා වූ කොටස් අතිශය ගැඹුරු හිත් වලටයි අවශ්‍යය. ඒ කියන්නේ බොහොම තීක්ෂණ නුවණක් තිබෙන කල්පනාව සිහිය හොඳට තිබෙන හිත් වලට තමයි මේක ගොනුවෙන්නේ, මේක අහුවෙන්නේ. මේක අමුතු විදියේ ශක්තියක් ගුණයක් කියා දීමක් මේ සිද්ධ කරන්නේ. මෙතැන භාවනා කරන්නෙක්වත් භාවනා කරවන්නෙක්වත් කියවෙන්නේ නෑ. මෙතැන චිත්ත චෛතසික රූප වල වැඩ සටහන් තමයි කියවෙන්නේ. සම්මත වශයෙන් සූත්‍ර අනුසාරයෙන් ගත්තහම අපේ ධර්ම සාකච්ඡාවේ ධර්මය කියලා දෙන එක්කෙනෙක් ඉන්නවා. ධර්මය අහන පිරිසක් ඉන්නවා. හැබැයි මේ ධර්ම දේශකයා බිඳ බැලු කළ එතැන තිබෙන්නේ චිත්ත ශක්ති චෛතසික ශක්ති එනම් චිත්ත ගති ටිකක් සහ

රූප. දැන් මේ චිත්ත චෛතසික රූප කියන්නා වූ ධර්ම ටිකත් යම්කිසි තැනක ක්‍රියාත්මක වෙනවා. ශබ්ද හදනවා. ඊට පස්සේ වාග් විලාස ඇතිකරනවා. විතක්ක විචාර ඇතිවෙලා යනවා. මෙතැන රූප ධර්ම ටිකක් චිත්ත ධර්ම ටිකක් චෛතසික ධර්ම ටිකක් ක්‍රියාත්මක වෙනවා. ධර්ම ශක්ති ටික එක තැනක operate වෙනවා ඇරෙන්න වෙන මොකක්වත් සත්වයෙක් එහෙම නෑ. ඕක සූත්‍රයට ගියහම තමයි දේශකයෙක් ඉන්නවා අසන්නෝ ඉන්නවා කියලා ගන්නේ. එතකොට අසනන්ගේ පැත්තෙන් බැලුවොත් එහෙම මම දේශනා කරනකොට අසාගෙන ඉන්නා වූ අය අපි සූත්‍රානුසාරයෙන් ශ්‍රාවකයෝ කියලා කියනවා. බණ අහන අය කියලා කියනවා. නමුත් ඇත්තටම සිද්ධ වෙන්නේ චිත්ත චෛතසික රූප ටිකක් තැන් තැන් කීපයක එකට වැඩ කරනවා. ඒ ටික තමයි සිද්ධ වෙන්නේ. ශබ්ද කියලා ඇහෙනවා. ඒක රූපයක්. ඊට පස්සේ ඒ ඇහිච්ච දේ හිතෙන් හිතනවා චෛතසික එක්ක දාල. චිත්ත චෛතසික ධර්ම ගොනුකර කර ඒවා හොඳට මෙනෙහි කර කර මෙනෙහි කර කර ඉන්නවා. එතැන තිබෙන්නේත් ඇත්ත වශයෙන්ම නාම ධර්ම ක්‍රියාත්මක වීමක්. රූප ධර්ම ක්‍රියාත්මක වෙනවා. නාම ධර්ම ක්‍රියාත්මක වෙනවා. චිත්ත චෛතසික රූප ක්‍රියාත්මක වෙනවා ඇරෙන්න අසන්නෝ කියලා ජාතියකුත් නෑ. බණ අහන අය කියලා ජාතියකුත් නෑ. සූත්‍ර අනුසාරයෙන් ගත්තහම තමයි අසන්නෝ ඉන්නේ. ඒක නිසා මේ ශක්තිය මේ ගොනුව මේ ධර්ම ස්වභාවයෝ කියලා හඳුන්වන්නා වූ කාරණය බුදුරජාණන්වහන්සේ විසින් විශේෂයෙන්ම කියලා දෙන්නේ උග්ඝටිතඤ්ඤ නැත්නම් ඒ වගේ උසස් තීක්ෂණ ප්‍රඥාවක් තිබෙන්නා වූ අයට.

සූත්‍ර දෙශ්නාවල් ඇහෙනකොට ඒක ඒ තරම් හිතන්න ඕන නෑ. මට ගැලපෙන්නේ මේ ටිකයි කියලා තමන් හිතා ගත්තම හරි. එතකොට බාධකයක් වෙන්නේ නෑ. මේ දෙශ්නාවල් තුල හොඳට හිත පිහිටුවාගෙන කටයුතු කරන්න. අනිත් ලෝකයට සම්බන්ධ දේවල් පිළිබඳ වැඩිය හිතන්නේ නැතුව හිටියම සූත්‍ර ප්‍රශ්නය මග හැරෙනවා. අනිත් එක තමයි සූත්‍ර දේශනා වලත් මේ වගේ කියලා දෙන්නා වූ ස්කන්ධ මාතෘකා තිබෙනවා. ආයතන මාතෘකා තිබෙනවා. ධාතු මාතෘකා තිබෙනවා. ඊළඟට චතුරාර්ය සත්‍යය ධර්මයන් කියලා දෙන මාතෘකා තිබෙනවා. ඒක නිසා සූත්‍ර දේශනා වලත් තිබෙනවා ගැඹුරට යන තැන් තිබෙනවා. නමුත් ඊටත් වඩා බෙදීම් වැඩියි මේ අභිධර්මයේ.

තව එකක් තමයි මේවා හඳුනාගෙන හඳුනාගෙන ගියහම අවසානයේදී වෙන්නේ චරිමක චිත්තය කියලා එකක් තිබෙනවා. චරිමක චිත්තය කියලා කියන්නේ චුති සිතක්. ඒ චුති සිත රහතන්වහන්සේලාගේ චුති සිත. ඒ චුතිසිත යම් කිසි වේලාවක පහළ වෙනවා. ඒ චුති සිත පහළ උනාට පස්සේ වෙන එක හිතකවත් නෑ. රහතන්වහන්සේ නමකගේ ජීවිතියක රහතන්වහන්සේ නමක් හැටියට ඒ චිත්ත චෛතසික ධර්මයන්ට අනුකූලව රූප ධර්ම වැඩ කරන්නේ ප්‍රවෘත්ති විපාක වැඩ කරන්නේ විඤ්ඤාණය කියන එක ශරීරයකට සම්බන්ධ වෙලා තිබෙනකම් විතරයි. චරිමක චිත්තය කියලා කියන්නේ රහතන්වහන්සේලාගේ චුති චිත්තයෙන් පස්සේ අර වැඩ කරපු චෛතසික ඔක්කෝම ටික මෙච්චර කාලයක් සංසාරේ හිත හිතා හිත හිතා ආපු හිත් පේළියේ ඔක්කොම ටික ආයේ කවදාකවත් නිකමටවත් පරම්පරාවේ චෛතසික දෙක තුනක් එක්කවත් ඒ චිත්ත චෛතසික set එක රූප set එක කවදාකවත් ආයේ පහළ වෙන්නේම නෑ. කොහේට ගියාද කියලා තේරුම් ගන්නත් බෑ.

මේ පහළ වේවී පහළ වේවී රූපයට සම්බන්ධ වෙලා තිබ්ච්ච මේ හිත මේ චිත්ත චෛතසික ශක්ති ටිකට මොකද උනේ කියලා හොයා ගන්නවත් නෑ. ඒක නිකම්ම නැතිවෙලා ගිහිල්ලා. ඒකට කියනවා නිවීම කියලා. ඇත්තටම අපි නිවන්නේ මොකක්ද? චිත්ත චෛතසික රූප. මේ ටික නැවත ක්‍රියාත්මක වෙන්නේ නැති තත්වයට පත්කරනවා. අපිට දැන් වෙලා තිබෙන්නේ ඒ ශක්ති ටික ඔක්කෝම ගිනි අරගත්තා වගේ ඔක්කොම එකට එක පොදි ගැහිලා. චිත්ත ටික චෛතසික වලට ඔට්ටු වෙනවා, චෛතසික ධර්ම සිතත් එක්ක ඔට්ටු වෙනවා. චෛතසික ධර්ම වලත් මේ තිබෙන **හේතු ධර්ම** අනිත් ඒවාට ඔට්ටු වෙනවා. ඒවා මේවාට හේත්තු වෙනවා. ඒවත් එක්ක ඉන්න රූපය ඒකෙන් ආයේ ගන්නවා. ඉතින් ඔය විදියේ රූප ශක්ති ටිකයි චිත්ත ශක්ති ටිකයි චෛතසික ශක්ති ටිකයි ඔවුනොවුන්ට හේත්තුවෙලා එකට බැදිලා එකට ගුලිවෙලා ඔහේ ක්‍රියාත්මක වේවී තිබෙනවා. අපි මේ දැවෙනවා කියලා කියන්නේ පත්තුවෙනවා ඇවිලෙනවා කියලා කියන්නේ ඔන්න ඔය ටික තිබෙන නිසා. ඊළඟට මේක continuation එහෙකට දාල තිබෙනවා අපි. Continuation එක කියලා කියන්නේ මේක නැති වෙනවාට කැමති නැති එකක් අපිට ඇතිවෙලා තිබෙනවා. ඒක නිසා මේක පවත්වාගෙන යාමට යම් යම් දේවල් කරන ශක්තිය හැදෙනවා. අයින් කරන ශක්තිය හැදෙන්නේ නෑ. ඔය විදියේ ප්‍රශ්නයක් තමයි මේකේ තිබෙන්නේ. යම්කිසි දවසක රහත් භාවයට පත් උනායින් පස්සේ අවසාන චරිමක චිත්තයෙන් එහාට අපි ඔක්කොම ටික කවදාකවත් සිතක් නැති කවදාකවත්ම චෛතසිකයක් නැති ඒක නිසාම ලෝභ හේතු මොකක්වත් කථා කරන්නත් නැති ඇහෙන්නෙත් නැති බණක් වත් ඇහෙන්නේ නැති සාකච්ඡාවත් නැති මොකක්වත්ම නැති ශාන්ත වූ අති මිහිරි වූ මදුර වූ ප්‍රනීත වූ සුක්ෂම වූ ධර්ම ස්වභාවයකට පත්වෙලා මේ ටික ඔක්කොම නැති වෙලා යනවා. ඒක තමයි අපේ aim එක. ඒක නිසා මේ ශක්ති ටිකක් තමයි වැඩ කරන්නේ.

තෙරුවන් සරණයි!

<u>ප්‍රශ්නය</u> - අවසරයි ස්වාමීන්වහන්ස හේතු ප්‍රත්‍යය වෙන්නේ චිත්තජ රූප වලට විතරද අනිත් රූපවලට ප්‍රත්‍යය වෙන්නේ නැත්ද?

<u>පිළිතුර</u> - ඒකෙදි ප්‍රත්‍යය වෙනවා ප්‍රතිසන්ධි අවස්ථාවේදී. ප්‍රතිසන්ධි අවස්ථාවේදී කර්මජ රූපවලට ප්‍රත්‍යය වෙනවා. ඒකෙම continuation එකක් වශයෙන් තමයි ප්‍රවෘත්ති අවස්ථාවේදී ප්‍රත්‍යය වෙනවා. නමුත් මෙතැන අපි කුසල් සිත් හැටියට කථාකරන තැන අකුසල් සිත් හැටියට කතාකරන තැන චිත්තජ රූප වලට හේතු ප්‍රත්‍යය ගැනෙන විදිය තමයි ඉස්මතුකරලා දෙන්නේ. තව තිබෙනවා ඉස්සරහට බලපාන දේවල් ඔය කර්මජ රූප ගැන. හැබැයි හේතු ප්‍රත්‍යය කියන ඒවා ප්‍රවෘත්ති අවස්ථාවේදී බල පවත්වනවා continuation එකක් හැටියට නමුත් ඒක ප්‍රතිසන්ධි අවස්ථාව තමයි මුඛ්‍ය අවස්ථාව. අනිත් අවස්ථාවේදී චිත්තජයි.

<u>ප්‍රශ්නය</u> - ස්වාමීන්වහන්ස **කුසලා හෙතූ සම්පයුත්තකානං ඛන්ධානං හෙතුපච්චයෙන පච්චයො** කියපු තැන භාවනාවක් වශයෙන් හෝ ඒක බලන වේලාවට **සම්පයුත්තකානං ඛන්ධානං** කිව්වහම සතර නාම ධර්ම වේදනා සංඥා සංඛාර විඤ්ඤාණ කියලා ගත්තහම සාමාන්‍යයෙන් අපි මූලික වශයෙන් බලනකොට වේදනා චෛතසිකය සංඥා චෛතසිකය

ඒ දෙක හැර ඉතිරි චෛතසික 50 සංඛාර වශයෙන් සහ සිත් 89 විඤ්ඤාණ වශයෙන් අරගෙන තිබෙනවා මම දැකලා තිබෙනවා. දැන් ස්වාමීන්වහන්ස මේ වගේ තැන් වලදී කුසල ධර්ම ගැන කථා කරන නිසා වේදනා චෛතසිකය සංඥා චෛතසිකය හැර සංඛාර කියන ගොඩට අයිති වෙන්නේ කුසල චෛතසික ටිකද? විඤ්ඤාණ කියනකොට ඇතිවෙන්නේ අහේතුක සිත් අකුසල සිත් හැර කුසල් සිත්ද කියලා පොඩ්ඩක් පැහැදිලි කරලා දෙන්න ස්වාමීන්වහන්ස. තෙරුවන් සරණයි!

<u>පිළිතුර</u> - එතැනදී **කුසලා ධම්මා** කියලා කියන්නේ **හේතු ධර්මයෝ**. ඔතැන **කුසලා හේතු** කියලා කියනවා. **කුසලා හෙතූ සම්පයුත්තකානං ඛන්ධානං** කියනතැන කුසලා හේතු කියනකොට ගන්නේ කුසල හේතු තුන. ඒ කියන්නේ 'අලෝභයයි' 'අදෝසයයි' 'අමෝහයයි'. එතකොට ඒ තුන්දෙනා අයින්වෙනවා. ඊළඟට වේදනා සංඥා සමග ඔය තුන්දෙනා නැතුව අනිත් **චෛතසික ටිකයි හිතයි** තමයි සලකන්නේ කුසල ඛන්ධ හැටියට. සාමාන්‍යයෙන් කුසල් සිතක පහළ වෙන වැඩිම තිබෙන්නේ චෛතසික 38 යි. අපි උදාහරණයක් හැටියට මෙහෙම හිතමු. නමුත් මේක වෙන්නේ නෑ. අපි හිතමු මේ චෛතසික 38 ම එක කුසල හිතක පහළ උනා කියලා. එතකොට ඒ හිත තමයි විඤ්ඤාණ ස්කන්ධය. ඒ විඤ්ඤාණස්කන්ධය ගැලෙව්වා. ඒකෙ තිබෙන චෛතසික 38 වේදනා ස්කන්ධයට එකක් අයිතියි. තව 37 ක් ඉතිරියි. සංඥා ස්කන්ධයට තව එකක් අයින් කරනවා. එතකොට චෛතසික 36 ඉතිරියි. ඒ 36 න් තුනක් අයින් කරනවා **හේතු** හැටියට. 'අලෝභය' 'අදෝසය' සහ 'අමෝහය'. එතකොට තව 33 ඉතිරියි. **ඒ 33 යි වේදනා චෛතසිකයි සංඥා චෛතසිකයි ඊළඟට විඤ්ඤාණයයි තමයි සලකන්නේ කුසලා හෙතූ සම්පයුත්තකානං ඛන්ධානං කියනතැන.**

හැබැයි මෙහෙම එකකුත් තිබෙනවා. ප්‍රශ්නයක් එනවා ඇයි 'අලෝභ' 'අදෝස' 'අමෝහ' හේතු තුන්දෙනාට කුසලා හේතු කියලා අනිත් ඒවාට කුසල ධර්ම කියලා කිව්වේ කියලා. එහෙම නැත්නම් කුසල ඛන්ධ කියලා කිව්වේ කියලා. එහෙම කියන්න හේතුව මේ තුන්දෙනා යම්කිසි තැනක ගැවිලා ඉන්නවා නම් අනිත් ඒවා ඔක්කෝම කුසල ධර්ම හැටියට තමයි සලකන්නේ. ඒ ගොල්ලන්ගේ බලපෑම් යනවා. යම්කිසි අවස්ථාවකදී අපි හිතමු කපුරු කෑල්ලක් දානවා ඇඳුම් පෙට්ටියකට. ඇඳුම් පෙට්ටියකට කපුරු කෑල්ලක් දැම්මයින් පස්සේ අර පෙට්ටියේ තිබෙන ඔක්කෝම ඇඳුම් වලට කපුරු සුවඳ මිශ්‍ර වෙනවා. ඒක තමයි ස්වභාවය. හැබැයි කපුරු ගොඩක් නෑ. එකතැනකට එක කෑල්ලක් දැම්මයින් පස්සේ ඒකෙ බලය අනිත් හැම තැනටම පැතිරෙනවා. ඒක නිසා කපුරු වල සුවඳ ගතිය ඇඳුම් වල තිබෙනවා. ඇඳුම් වල කපුරු නෑ. හැබැයි කපුරු සුවඳ තිබෙනවා. හඳුනුත් ඒවගේ. ඒක නිසා මේ 'අලෝභ' 'අදෝස' 'අමෝහ' තුන්දෙනා අර විදියට තමයි බෙදන්නේ.

තව එකක් මතක තියා ගන්න. ඕක එක හිතේ බලන ක්‍රමයකුත් තිබෙනවා. මෙහෙම හිතන්න බලන්න. දැන් ජවන් සිතක් පහළ වෙනවා. ඒ ජවන් සිතේ අපි ගමු චෛතසික 33 ක් තිබෙනවා කියලා. මනුස්සයෙක් වාඩිවෙලා අනාපාන සති භාවනාව වඩනවා බොහොම ශ්‍රද්ධාවෙන්. අනාපාන සති භාවනාව වඩනකොට එයාගේ සිතේ පහළ වෙනවා ආශ්වාස

ප්‍රශ්වාස බලන්නා වූ සිත් ටිකක්. ඒ සිතේ තිබෙන්නේ 'අලෝභ' 'අදෝස' 'අමෝහ'. අපි බලමු මේකේ කොච්චර චෛතසික තිබෙනවද කියලා. සෝභන සාධාරණ තිබෙනවා 19ක්. ප්‍රඥා චෛතසික තිබෙනවා. එතකොට 20යි. අන්‍ය සමාන තිබෙනවා 13ක්. ඒ චෛතසික 33 රැදී වැඩ කරන සිත තිබෙනවා. එතකොට ඔක්කොම නාම ධර්ම 34යි. ඒ නාම ධර්ම 34න් අපි අයින් කරනවා තුන්දෙනෙක් එනම් 'අලෝභ' 'අදෝස' 'අමෝහ'. එහෙම අයින් කරහම අපිට ඉතුරු වෙනවා තව 31ක්. මේ තුන්දෙනා අනිත් 31 දෙනාට බලපානවා.

අනිත් එක තමයි මේ තුන්දෙනාගෙන් එක්කෙනෙක් ගන්නවා, අපි හිතමු අලෝභය. අලෝභය කියන එක 'හේතු නොවෙන' ධර්ම වලටත් බලපානවා. 'හේතු වෙන' ධර්ම වලටත් බලපානවා. ඊළඟට අමෝහය. අමෝහය හේතු හැටියට කථා කරන ධර්ම වලටත් බලපානවා. හේතු හැටියට කථා කරන්නේ නැති ධර්ම වලටත් බලපානවා. ඒක වෙන්නේ මෙහෙමයි.

**අලෝභය චෛතසික 30 + සිතටයි බලපානකොට අද්වේශයයි අමෝහයයි කියන දෙකටත් බලපානවා. ඒවත් හේතු.**

මේ 'හේතුව' සම්පයුත්තක අනිත් ධර්ම වලටත් බලපානවා. සම්පයුත්තක මේ හේතු දෙකටත් බලපානවා. ඒ විදියට තමයි එක වේලාවකදී තනියෙන් ගත්තොත් එහෙම බලපාන විදිය. අමෝහයත් ඒ වගේ. අමෝහය අලෝභයටත් බලපානවා වේදනාවටත් බලපානවා සංඥාවටත් බලපානවා. මේ තුන්දෙනාගේ ස්වභාවය ඕකයි. එකක් ගත්තොත් ඔය විදියයි. ලේසියට තුනක් ගත්තොත් එහෙම සංඛාර ස්කන්ධය හැටියට අනිත් ඒවා තමයි සලකන්නේ. ඔය විදියටයි. තෙරුවන් සරණයි!

ස්වාමීන්වහන්ස කුසල සිත තමයි එතැන විඤ්ඤාණය වෙන්නේ නේද ස්වාමීන්වහන්සේ?

<u>පිළිතුර</u> - ඔව්. ඒකට හේතුව සම්ප්‍රයුක්තක ධර්ම වෙන්නේ ඒ වෙලාවට තිබෙන එක. ඒ වෙලාවේ ඒ ක්ෂණයේ ඒ මොහොතේ පහළ වෙච්ච චිත්ත චෛතසික ධර්ම තමයි සම්ප්‍රයුක්ත ධර්ම. එතැන සිද්ධ වෙන්නාවූ දේ තමයි ගන්නේ. මේක හිතෙන් හිතට වෙනස්. හිතින් හිතට - හිතින් හිතට වෙන වෙනම බලාගෙන යන්න පුළුවන්. ඒ විදියටයි.

<u>ප්‍රශ්නය</u> - තෙරුවන් සරණයි ස්වාමීන්වහන්ස ඔබ වහන්සේ අද අපිට පැහැදිලි කරපු මුල් කරුණේ එනම් **අකුසලො ධම්මො අකුසලස්ස ධම්මස්ස හෙතුපච්චයෙන පච්චයො** කියන එකත් ඒවගේම **අකුසලා හෙතූ සම්පයුත්තකානං ඛන්ධානං හෙතුපච්චයෙන පච්චයො** කියන තැන ස්වාමීන්වහන්ස අකුසල ධම්ම හැටියට 'ලෝභ' 'දෝස' 'මෝහ' කියන හේතු ටික ගත්තා.

ඊළඟට ඒකෙන් ප්‍රත්‍යයවෙන ධර්ම හැටියට හිතා ගත්තා ලෝභ සිත 8 + ද්වේශ සිත් 2 + මෝහ සිත් 2.

ඒත් එක්කම **අකුසලස්ස ධම්මස්ස** කියනකොට ඒ සිත්වල තිබෙන අනෙකුත් චෛතසිකයන් ටික ගත්තහම ස්වාමින්වහන්ස එතැන තේරෙනවා අන්‍යසමාන 13 ත් අකුසල චෛතසික 14ත් ඔක්කොම චෛතසික 27ක් ඒකෙන් ප්‍රත්‍යය ලබනවා කියලා.

එකේදී ස්වාමීන්වහන්ස මෝහ සිත ගත්තොත් එක හේතුවක් යෙදෙන හින්ද ඒ මෝහය ඒ මොහයටම ප්‍රත්‍යය නොවෙන හින්ද ඒ මෝහය අනෙකුත් චෛතසික ධර්මයන්ට තමයි ප්‍රත්‍යය වෙන්නේ කියලා තේරුම් ගත්තා ස්වාමීන්වහන්ස.

ඊළඟට අවසාන **අබ්‍යාකතො ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස හෙතුපච්චයෙන පච්චයො** කියන තැනත් **විපාකාබ්‍යාකතා කිරියාබ්‍යාකතා හෙතූ සම්පයුත්තකානං ඛන්ධානං චිත්තසමුට්ඨානානඤ්ච රූපානං හෙතුපච්චයෙන පච්චයො** කිව්ව තැන සහේතුක විපාක සිත් පිළිබද ඔබ වහන්සේ අපිට සඳහන් කළා. එතැන සිත් 21 හැටියට තේරුණා. මහා කුසල විපාක සිත 8 + රූපී විපාක සිත් 5 + අරූපී විපාක සිත් 4 කුත් ඒවගේම ලෝකෝත්තර ඵල සිත් 4 කුත් ඔක්කොම 21 උනා.

ඒවගේම සහේතුක ක්‍රියා සිත් 17 තේරුම් ගත්තා ප්‍රත්‍යය උප්පන්න ධර්ම හැටියට. එතැනදී ස්වාමීන්වහන්ස කාමාවචර සිත් ක්‍රියා සිත් 8 + රූපාවචර ක්‍රියා සිත 5 ත් + අරූපාවචර ක්‍රියා සිත 4 ත් ගත්තහම 17 ක් වෙනවා. හසිත උප්පාද සිත් මෙතනට එන්නේ නෑ ඒවා අහේතුක නිසා. චෛතසික ධර්ම 38 ක් ගත්තා = අන්‍යසමාන 13 + කුසල චෛතසික 25 ක් විදියට තේරුම් ගත්තා ස්වාමීන්වහන්ස. අඩු පාඩුවක් තිබෙනවා නම් පැහැදිලි කරලා දෙන්න ස්වාමීන්වහන්ස.

<u>පිළිතුර</u> - බොහොම හොඳයි මහත්තයා මම බොහොම අවධානයෙන් අහගෙන හිටියා. ඒක එහෙම තමයි තිබෙන්නේ. දැන් ඔය චිත්ත චෛතසික රූප බෙදාගෙන කුසල අකුසල විපාක ක්‍රියා බෙදාගෙන ඊළඟට සහේතුක අහේතුක බෙදාගෙන ඔය විදියට බෙදාගෙන හිතේ රූපය ඇඳගෙන ඇස් දෙක පියාගෙන මනසිකාරය කරන්න පුළුවන්. යමක් කියනකොට මෙන්න මේ ටික තමයි වෙන්නේ කියලා. කිසිම වරදක් වෙන්නේ නෑ. ඒක නිසා තමයි මුලින්ම කිව්වේ භූමි භේදය කාමාවචර රූපාවචර අරූපාවචර ලෝකෝත්තර භූමි භේදයෙන් එයිට පස්සේ සිත් බෙදාගෙන ගියේ ඔය ටික කරගන්නයි. ඉතින් ඔය විදියට සිත් බෙදාගෙන චෛතසික ටිකත් කුසල අකුසල විදියට බෙදාගෙන ඊට පස්සේ සර්ව චිත්ත සාධාරණ අන්‍ය සමාන කියන ටික බෙදාගෙන ගියාට පස්සේ හොඳට මහත්තයා තේරුම් ගන්න පුළුවන්. මම මෛත්‍රීයෙන් ප්‍රර්ථනා කරනවා හැම එක්කෙනාටම ඔය වගේ නිරවුල් තේරුම් ගැනීමක් හදාගන්න හැකියාවක් ඇතිවේවා කියලා.

<u>ප්‍රශ්නය</u> - අවසරයි ස්වාමීන්වහන්ස ඒ ජයන්ත මහත්තයා කියපු විස්තරයෙදී චිත්තජ රූප කියවුනේ නෑ. චිත්තජ රූපත් අයිතිවෙනවා නේද ස්වාමීන්වහන්ස?

<u>පිළිතුර</u> - ඔව් චිත්තජ රූප අව්‍යාකෘතයි. ඒ මහත්තයා ගොඩක් කිව්වේ නාම ධර්ම පිළිබඳවයි. අව්‍යාකෘතයට රූප ධර්මත් අයිති වෙනවා.

<u>ජයන්ත මහත්මයා</u> - එහෙමයි ස්වාමීන්වහන්ස ඉස්සෙල්ලා Bruno මහත්මයාගේ ප්‍රශ්නයෙදීත් තේරුණේ හේතු ප්‍රතයාය ගැන කථා කිරීමේදී අපි ප්‍රතිසන්ධි කර්මජ රූප ගැන කථා කරනවා 'හේතු ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය' වෙනවා කියලා. එතැනදි ගන්නේ ඒ අවස්ථාවේදීම පහළ වෙන රූප කොටස තමයි ස්වාමීන්වහන්සේ අපිට විස්තර කරලා දීපු විදියට. ඒක නිසා තමයි මෙතැනට කර්මජ රූප සම්බන්ධ කරලා නැත්තේ කියලා හිතුනා.

<u>ස්වාමීන්වහන්සේ</u> - ඒක හරි බොහොම හොඳයි. ඒ කියන්නේ ප්‍රතිසන්ධි අවස්ථාවේදී තමයි ඇත්තවශයෙන්ම හේතු ධර්ම කෙලින්ම කර්මජ රූප වලට බලපාන තැන. ඒක තේරුම් ගන්න පුළුවන් මෙහෙම. අපිට දැන් කර්මජ රූප පහළ වෙනවා. අපි නිදාගත්තහමත් හිත දුවනවා. එතකොට අපිට අනිත් සිත් පහළ උනා කියලා ප්‍රශ්නයක් නෑ. හැබැයි චිත්තජ රූප එහෙම නොවෙයි. චිත්තජ රූප මේ සිතත් එක්ක චෛතසික set එකක් පහළ වෙන පහළවෙන හැම ක්ෂණයකම ඒකට අදාළ රූප හැදෙනවා. ඒක කෙරෙන්නේ එතැනට ඉදිරපත් වෙච්ච හේතු ධර්මය නිසා. ඒක නිසා තමයි චිත්තජ රූප වැඩිය උලුප්පවලා ප්‍රවෘත්ති අවස්ථාවේදී කථා කරන්නේ.

<u>ජයන්ත මහත්මයා</u> - හොඳමයි ස්වාමීන්වහන්ස ඔබවහන්සේගේ කාලය සලකල අද දේශනාව සහ සාකච්ඡාව නිමාවට පත්කරන්න පුළුවන්. එම නිසා ඔබ වහන්සේට ඉතාමත්ව ගෞරව පූර්වකව සවනට සිසිලස වෙනුවෙන් පුණ්‍යානුමෝදනා කරනවා ස්වාමීන්වහන්ස අපි වෙනුවෙන් කරන විසාල සේවයට. ඔබවහන්සේට ඉතාමත්ම ගෞරවයෙන් යොමු වෙනවා අද දවසේ සාකච්ඡාව නිමා කරන්න කියලා ස්වාමීන්වහන්ස. තෙරුවන් සරණයි!

<u>ස්වාමීන්වහන්සේ</u> - හොඳයි සැමදෙනාටම ශාන්තියක් සැනසිල්ලක් වේවා! ඉතින් අපි සුපුරුදු විදියට අදත් **හේතු ප්‍රත්‍යය** කියන ධර්මය මුල් කරගෙන **වීථිවාර හෙවත් විසර්ජනා වාර හතක්** කථා කළා මේ සතිදෙකේ. ඒක නිසා **හේතු ප්‍රත්‍යය** ගැන කථා කරනකොට මතක තබා ගන්න අපේ පින්වතුන් **වීථිවාර විසර්ජනා** වාර හතක් මේකට ඉදිරිපත් වෙලා තිබෙනවා කියලා. මේ ධර්මය කථා කිරීමෙන් මෙනෙහි කිරීමෙන් සැමදෙනාගේම සිත්වල කුසල ධර්මය අරමුණු කරගත්ත චිත්ත ධර්ම චෛතසික ධර්ම රූප ධර්ම අරමුණු කරගත්ත ලෝභ නැති ද්වේශ නැති මෝහ නැති හොඳ පිරිසිදු කුසල් සිත් පරම්පරාවක් ධර්ම ගොනු ධර්මමිටි ධර්ම පරම්පරාවල් පහළ උනා. ඉතින් මේ සියල්ලක්ම පහළ වෙන්න මේ මාතෘකාව ගැන කථා කළේ භව ගාමී වීමට නොවෙයි. මේක නවතින තැනටයි. ඒ නවතින තැන තමයි නිර්වාණ ධාතුව. ඒ නිර්වාණ ධාතුව අවබෝධ කරගැනීමට ඒ ශාන්ත වූ සුන්දර වූ ප්‍රනීත වූ නිර්වාණ ධාතුව අවබෝධ කරගන්න ඒකාන්තයෙන්ම මේ ධර්ම සකච්ඡාව මෙනෙහි කිරීම මනසිකාරය ඒකාන්තයෙන්ම හේතු වාසනා වේවා! කියලා මෛත්‍රීයෙන් ප්‍රාර්ථනා කරනවා.

අපේ පින්වත් ලලිත් දළුවත්ත මහත්මයාටත් ඒ පවුලේ සැම දෙනාටමත් පින්වත් ජයන්ත මහත්මයාටත් මේ ප්‍රශ්න අහපු මහත්ම මහත්මීන් සැමට සැනසීමක් වේවා! අපේ මේ ලලිත් මහත්මයා ආරම්භ කරපු වැඩ සටහනේ තවත් සන්ධි ස්ථානයක් මේ ඉදිරිපත් වෙලා තිබෙන්නේ. ඒ නිසා ඒ කල්‍යාණ මිත්‍රත්වයෙන් ඉදිරිපත්වෙලා ලෝකයට පිහිට වෙන්නාවූ ඒ මහත්මයාට චිරාත් කාලයක් නිදුක් නිරෝගී දීර්ඝායුෂ වේවා! ඒවාගේම හොඳට අධ්‍යාත්මික ධර්ම ශක්තිය දියුණු කරලා නිවනින් සැනසෙන්න ලැබේවා! ඒවාගේම ලෝකවාසී මේවා අසාගෙන සිටින්නා වූ හිතන්නා වූ මෙනෙහි කරන්නා වූ සැම දෙනාටමත් මේ පින් බලයෙන් උතුම් වූ චතුරාර්ය සත්‍යය ධර්මයන් අවබෝධ කොට නිවනින් සැනසීම ලැබේවා! කියලා මෛත්‍රීයෙන් ප්‍රාර්ථනා කරනවා. සැම දෙනාටම තෙරුවන් සරණයි!

සාධු! සාධු! සාධු!

**සීලවන්තං ගුණවන්තං - පුඤ්ඤක්ඛෙත්තං අනුත්තරං**
**දුල්ලභෙන මයා ලද්ධං - පස්සිතුං වන්දිතුං වරං**
**සාරිපුත්තාදි ථේරානං - ආගතං පටිපටියා**
**සද්ධා සීලං දයා වාසං - බුද්ධ පුත්තං නමා මහං**



ඉහත සඳහන් ධර්ම දේශනාව

අති පූජ්‍ය හන්තේ ජිනාලංකාර ස්වාමීන්වහන්සේ විසින් දේශිතයි